www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# මැරියට් හෝටලයේ බෝම්බ ප්‍රහාරය: පකිස්ථානයේ ගැඹුරු වන අර්බුදය පිලිබඳ තවත් සලකුනක්

## Marriott Hotel bombing: another sign of Pakistan’s deepening crisis

**පීටර් සිමන්ඩ්ස් විසිනි**
**2008 සැප්තැම්බර් 22**

සෙනසුරාදා හැන්දෑවේ ඉස්ලාමාබාද්හි සුඛෝපභෝගී මැරියට් හෝටලය වනසා ලූ දැවැන්ත බෝම්බ පිපිරීම වනාහි බුෂ් පාලනාධිකාරය සිය “ත්‍රස්තවාදයට එරෙහි යුද්ධය” පැතිරවීම මගින් පකිස්ථානය තුල නිර්මානය වූ ගැඹුරු වන දේශපාලන අර්බුදය පෙන්නුම් කරන තවත් සලකුනකි. කිසිවෙකු වගකීම භාර ගෙන නැති නමුත්, මේ පිපිරවීම නිසැක වශයෙන් ම, රටේ ඇෆ්ඝනිස්ථාන දේශ සීමා කලාපයේ දී එක්සත් ජනපද හා පකිස්ථාන හමුදාවලින් ඉස්ලාමීය සන්නද්ධ කන්ඩායම්වලට නොකඩවා එල්ල වන ප්‍රහාරවලට එරෙහිව කල පලි ගැනීමක් විය.

හෝටලයේ ආරක්ෂක දොරටුවෙහි කුනු ලොරියක් නතර කරවනු ලැබීමෙන් අනතුරුව එය පිපිරී යන සැටි පෙන්වන විඩියෝ පටයක් පරීක්ෂකයන් විසින් සොයා ගනු ලැබ ඇත. ටොන් භාගයක පුපුරන ද්‍රව්‍යවලින් සිදු වන්නට ඇතැයි ගනන් බලා ඇති මේ පිපිරීමෙන් මීටර 20ක පමන පලලින් ද මීටර 8ක පමන ගැඹුරින් ද යුතු දැවැන්ත ආවාටයක් නිර්මානය විය. වේගයෙන් හෝටලය ගිල ගත් ඉන් මෙලවුනු ගින්න පාලනය කිරීමට පැය 12ක් ගත විය. අඩු ගනනේ පුද්ගලයන් 53 දෙනෙකු පමන ඝාතනයට ලක් වූ අතර, 250කට වැඩි සංඛ්‍යාවක් තුවාල ලදහ. මිය ගිය පිරිස අතර චෙක් ජනරජ තානාපති අයිවෝ ස්ඩැරෙක්, වියට්නාම් කාන්තාවක් සහ නම සඳහන් නොකල එක්සත් ජනපද ආරක්ෂක දෙපාර්තමේන්තු නිලධරයන් දෙදෙනෙක් වූහ.

බෝම්බ ප්‍රහාරය පැහැදිලිව ම පකිස්ථාන ආන්ඩුවට පනිවුඩයක් යැවීමේ ඉලක්කය ඇතිව සිදු කෙරුනකි. මැරියට් හෝටලය පිහිටා තිබෙන්නේ ඉස්ලාමාබාදයේ දේශපාලන කේන්ද්‍රස්ථානයෙහි ය; පාර්ලිමේන්තු ගොඩනැගිල්ල, අගමැතිවරයාගේ නිල නිවස, ජනාධිපති කාර්යාලය හා විදේශ තානාපති කාර්යාල සමීපයේ ය. අගනුවර පිහිටි තරු පහේ හෝටල දෙකෙන් එකක් වන එහි ඉහල පෙලේ විදේශීය අමුත්තන් හා ආන්ඩුවේ නිලධරයන් මෙන් ම අගනුවර ව්‍යාපාරික ප්‍රභූව ද නිරතුරුව ගැවසෙති. අභ්‍යන්තර කටයුතු පිලිබඳ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධරයෙකු වන රෙහ්මාන් මලික් වහා ම කියා සිටියේ, “සියලු මාවත් යොමු වන්නේ ෆාටා [FATA – Federally Administered Tribal Areas (මධ්‍යම ආන්ඩුවේ පරිපාලනය යටතේ පවතින ගෝත්‍රික ප්‍රදේශ) ] වෙත” බව යි. යාබද ඇෆ්ඝනිස්ථානයේ එක්සත් ජනපද මිලිටරි වාඩි ලා ගැනීමට විරෝධය පාන කැරලිකරුවන්ට සහාය දෙන සන්නද්ධ කන්ඩායම්වලට එරෙහිව මේ ප්‍රදේශවල දී පකිස්ථාන මිලිටරිය මේ වන විට මහා පරිමාන ප්‍රහාරයක් එල්ල කරමින් සිටී.

පිපිරීම සිදු වූයේ, පකිස්ථාන ජනාධිපති අසිෆ් අලි සර්දාරි රටේ පාර්ලිමේන්තුවේ ඒකාබද්ධ සැසියක් අමතා පකිස්ථානය “ත්‍රස්තවාදයේ විලංගුවලින්” මුදා ගන්නා බවට ප්‍රතිඥා දී පැය කීපයකට පසුව ය. මේ මස මුල සිය තනතුරේ වැඩ භාර ගත් තැන් පටන්, සර්දාරි සියුම් තුලනය කිරීමේ කටයුත්තක නියැලී සිටියි: එනම් ඔහු එක් අතකින් ෆාටා ප්‍රදේශයේ සිටින ඉස්ලාමීය සටන්කාමීන් මර්දනය කරන ලෙස එක්සත් ජනපදයෙන් කෙරෙන ඉල්ලීම්වලට හිස නමමින් ද අනෙක් අතින් මෙය එක්සත් ජනපදය වෙනුවෙන් කෙරෙන යුද්ධයක් යැයි වටහා ගෙන පැන නැගෙන මහජන කෝපය සමනය කිරීමට ප්‍රයත්න දරමින් ද සිටියි.

උදාහරනයක් ලෙස, ෂහිඩ් කමල් නිව් යෝක් ටයිම්ස් පුවත්පතට කියා සිටියේ රට තුල සිදු වෙමින් පවතින බෝම්බ පිපිරවීම් රැල්ලෙන් තමන් කැලඹීමට පත්ව සිටින බව යි. “මේක ෆාටාවේ සිදු වෙමින් පවතින දේට දක්වන ප්‍රතිචාරයක්” යැයි ඔහු කී ය. “අවුරුදු ගනනාවක් තිස්සෙ අපි ක්‍රියාත්මක කරමින් ඉන්නෙ නොසැලකිලිමත්, අපරික්ෂාකාරී පිලිවෙතක්. ෆාටාවෙ සිද්ධ වෙමින් තියෙන්නෙ පකිස්ථානුවො පකිස්ථානුවො ඝාතනය කරන එක.”

පකිස්ථාන භූමිය ඇතුලත දී එක්සත් ජනපදය එල්ල කල ප්‍රහාර සංඛ්‍යාව මේ මාසයේ පැහැදිලි ලෙස ඉහල යාමත් සමග ඇමරිකානු විරෝධී සතුරුකම වර්ධනය වී තිබේ. සැප්තැම්බර් 3 දා එක්සත් ජනපද විශේෂ බලකායන් විසින් සිදු කරන ලද, පලමු වරට තමන් කල බව ප්‍රසිද්ධියේ පිලිගත් ගොඩබිම් මෙහෙයුම ද මේ ප්‍රහාරවලට අයත් වේ. අඩු ගනනේ සිවිල් වැසියන් 20 දෙනෙකු වත් ඝාතනයට ලක් වූ මේ හදිසි ප්‍රහාරය සම්බන්ධයෙන් පකිස්ථාන හමුදා ජනරාල් අෂ්ෆාක් කයානි තියුනු ප්‍රතිචාරයක් දැක්වී ය; තවත් එවන්

ප්‍රහාරවල යෙදුන හොත් ඒවාට ප්‍රතිප්‍රහාර එල්ල වනු ඇතැයි ඔහු අනතුරු ඇඟවී ය. දේශ සීමාව හරහා ගොස් දෙවන ප්‍රහාරයක් එල්ල කිරීමට උත්සාහ දරමින් සිටි එක්සත් ජනපද සොල්දාදුවන්ට පකිස්ථාන යුද භටයන් විසින් වෙඩි තබන ලදැයි වාර්තා වීමත් සමග, දෙපාර්ශ්වය අතර සබඳතා පිලිසකර කර ගැනීම සඳහා එක්සත් ජනපද මිලිටරි කාර්ය මන්ඩලයේ ඒකාබද්ධ අන දෙන නිලධාරි අද්මිරාල් මයික් මුලන් පසු ගිය සතියේ හදිසියේ ඉස්ලාමාබාදයට සංචාරය කලේ ය.

එක්සත් ජනපද ප්‍රහාර සම්බන්ධයෙන් පකිස්ථාන මිලිටරිය තුල හා පලල් මහජනතාව අතර පවතින විරුද්ධත්වය පිලිබඳව බරපතල ලෙස සංවේදී වූ සර්දාරි සෙනසුරාදා පාර්ලිමේන්තුව හමුවේ මෙසේ කියා සිටියේ යː "ඕනෑම බලවතෙක් ත්‍රස්තවාදයට විරුද්ධව සටන් කිරීමේ නාමයෙන් අපේ ස්වෛරී භාවය හා භෞමික අඛන්ඩතාව උල්ලංඝනය කරන එක අපි ඉවසා ගෙන ඉන්නෙ නැහැ." මේ ප්‍රකාශය වනාහි පුලුල් උද්යෝගී පිලිගැනීමක් ජනිත කල දීර්ඝ වූත් නිශ්චිත අදහස්වලින් තොර වූත් කතාවක එක මොහොතක් පමනක් විය. ව්‍යවස්ථාදායක සභාවේ සාමාජිකයෝ සිය මේසවලට තට්ටු කරමින් ඊට සිය අනුමැතිය පල කලහ. තමන්ට කලින් බලයේ සිටි මිලිටරි බලවන්තයෙකු වූ ජනරාල් පර්වේස් මුෂාරෆ් සම්බන්ධයෙන් සිදු වූවාක් මෙන් තමන් වොෂින්ටනයේ රූකඩයක් යැයි හංවඩු ගැසෙන්නට ඉඩ දිය නොහැකි බව ගැන සර්දාරි හොඳින් දැනුවත් ය.

කෙසේ වුව ද, සර්දාරි දෙබිඩි සෙල්ලමක යෙදී සිටින බව පෙනේ. එනම්, ඔහු පකිස්ථාන ස්වෛරී භාවයේ ආරක්ෂකයෙකු ලෙස ප්‍රසිද්ධියේ පෙනී සිටින අතරවාරයේ ෆාටාවේ යුද්ධය ඉහල නංවන ලෙස එක්සත් ජනපදය කරන ඉල්ලීම් රහසේ ඉටු කරමින් සිටින බව පෙනේ. මැරියට් හෝටලයේ බෝම්බ ප්‍රහාරයෙන් අනතුරුව පරීක්ෂනයට සහාය වීම සඳහා එෆ්බීඅයි ඒජන්තයන් එවීමට එක්සත් ජනපදය ඉදිරිපත් කල අදහස බලගතු ලෙස ප්‍රතික්ෂේප කරමින් අභ්‍යන්තර කටයුතු පිලිබඳ අමාත්‍යාංශයේ නිලධාරි රෙහ්මාන් මලික් මෙසේ කී යː "අපට උදව් අවශ්‍ය නැහැ; අපි ඒක ප්‍රතික්ෂේප කරනවා." කෙසේ වුව ද, මේ අතරවාරයේ *ලොස් ඇන්ජලිස් ටයිම්ස්* පුවත්පත වාර්තා කලේ, කැරලි-මර්දන පුහුනුව සම්පාදනය කිරීම සඳහා එක්සත් ජනපද මිලිටරි උපදේශකයන් දුසිම් ගනනක් පකිස්ථානයට එවීම පිලිබඳ පමා වී තිබෙන සැලසුම් පෙරට ගෙන යා හැකි බවට පකිස්ථාන ආන්ඩුවත් මිලිටරියත් පසු ගිය සතියේ අද්මිරාල් මුලන්ට නිහඬව යලි සහතික වූ බව යි.

එමෙන් ම, මුලන් ඉස්ලාමාබාදයෙහි සිටින අතරවාරයේ දක්ෂින වසිරිස්ථානයේ බාග් ගම්මානයේ පිහිටි සටන්කාමීන්ගේ පුහුනු කඳවුරක් යැයි කියනු ලබන ස්ථානයකට තවත් එක්සත් ජනපද මිසයිල ප්‍රහාරයක් එල්ල විය. මිනිසුන් රහිත එක්සත් ජනපද ප්‍රහාරක යානාවකින් එල්ල කරන ලද මේ ප්‍රහාරයෙන් අඩු ගනනේ හය දෙනෙක් ඝාතනයට ලක් වූහ. මේ මාසයෙහි මේ දක්වා වූ කාලය තුල එක්සත් ජනපද මිලිටරිය හෝ සීඅයිඒ සංවිධානය විසින් පකිස්ථාන භූමි ප්‍රදේශය මත මිසයිල ප්‍රහාර හයක් වත් දියත් කොට තිබේ. සන්සන්දනාත්මකව ගත හොත් 2007 වසර පුරා ම එල්ල වූයේ ප්‍රහාර තුනක් පමනි. පකිස්ථාන ආරක්ෂක ඇමති අහ්මඩ් මුක්තාර් ප්‍රහාරය සම්බන්ධයෙන් සිය

"මවිතය" ප්‍රකාශ කල ද, දේශීය රහස් ඔත්තු නිලධරයන් *ටයිම්* සඟරාවට කියා සිටියේ මිසයිල ප්‍රහාරය වනාහි වැඩි දියුනු වූ "එක්සත් ජනපද-පකිස්ථාන රහස් ඔත්තු සේවා හවුල්කාරකමේ" ප්‍රතිඵලයක් බව යි.

පකිස්ථාන ටෙහ්රික් තලේබානයේ හෝ ඊනියා පකිස්ථාන තලේබානයේ ධජය යටතේ දේශ සීමාබද ගෝත්‍රික ප්‍රදේශයෙහි ක්‍රියාත්මක වන සටන්කාමී කන්ඩායම් අතුගා දමනු වස් පකිස්ථාන මිලිටරිය දැනට මත් කුරිරු යුද්ධයක නිමග්න වී සිටී. බොහෝ දුරට මේ යුද්ධය පිලිබඳ තොරතුරු වාර්තා නො කෙරේ. ප්‍රාදේශීයව රැස් කර ගත් භටයන් 60,000කින් සවිමත් වූ දේශ සීමා බලකායක් ද ඇතුලත්ව 120,000ක් පමන වූ පකිස්ථාන යුද භටයෝ සංඛ්‍යාවක් ෆාටාහි ස්ථානගත කර තිබේ. දිනපතා ගැටුම් සිදු වෙමින් පවතින, 300,000ක් ජනයා තම නිවාස අත හැර පලා ගොස් ඇතැයි ගනන් බලා තිබෙන බජාවුර් ප්‍රදේශයෙහි මේ වන විට මහා පරිමාන මෙහෙයුමක් සිදු වෙමින් තිබේ.

මිලිටරි ප්‍රකාශක මේජර් මුරාඩ් ඛාන් පසු ගිය බ්‍රහස්පතින්දා *Bloomberg.com* වෙබ් අඩවියට කියා සිටියේ, කලින් දා සිදු වූ දරුනු සටනක දී අවම වශයෙන් තුවක්කුකරුවන් 19 දෙනෙකු ඝාතනයට ලක් වූ බව යි. "ලොඒ සාම් ප්‍රදේශය වටා පිහිටි සටන්කාමීන්ගේ මූලස්ථානවලටත් ආරක්ෂක ස්ථානවලටත් කාල තුවක්කු හා හෙලිකොප්ටර ප්‍රහාර එල්ල වී ඇතැ"යි ඔහු කී ය. සති හයකට කලින් මෙහෙයුම පටන් ගත් දා පටන් සටන්කරුවන් 700කට වැඩි සංඛ්‍යාවක් ඝාතනය කොට ඇති බව පකිස්ථාන ආරක්ෂක හමුදා කියා සිටියි. ප්‍රහාරවල දී මිලිටරිය යුද ගුවන් යානා ද යුද හෙලිකොප්ටර ද යොදා ගෙන ඇති බව පකිස්ථානයේ *ඇසෝසියේටඩ් ප්‍රෙස්* වාර්තා කොට තිබේ. හානියට පත් වූ සිවිල් වැසියන් පිලිබඳ කිසිදු සංඛ්‍යා ලේඛනයක් නිකුත් කොට නැත. එහෙත්, වගවිභාගයක් තොරව එවැනි වෙඩි බලයක් යොදා ගත් තතු තුල සිදු වී ඇති මරන සංඛ්‍යාව නිසැක වශයෙන් ම ඉහල මට්ටමක පැවතිය යුතු ය.

*ඩෝන්* පුවත්පත සෙනසුරාදා මෙසේ අනතුරු ඇඟවී යː "බජාවුර් බල ප්‍රදේශයෙහි සිදු වෙමින් පවතින සටන පකිස්ථානයේ අභ්‍යන්තර ආරක්ෂාව බිඳ දැමීමේ තීරනාත්මක අවස්ථාවට පත්ව තිබෙනවා පමනක් නො වේ. ත්‍රස්තවාදයට එරෙහි යුද්ධයේ දී එක්සත් ජනපදයේ

ප්‍රධාන සහකරුවෙකු ලෙස මේ රටේ තත්ත්වය කෙරෙහි ද ඉන් බලගතු බලපෑමක් ඇති විය හැකි ය." මෙහෙයුම හොඳින් සිදු වෙමින් පවතින බව නිලධාරින්ට හැඟේ යැයි සඳහන් කල පුවත්පත මෙසේ අදහස් දැක්වී යː

"කෙසේ වුව ද, සිවිල් ජීවිත හානි සංඛ්‍යාව ඉහල යාම මගින් දරුනු ජනතා හා දේශපාලනික ප්‍රතික්‍රියාව[ක]ට මග පෑදිය හැකි බවට ද බජාවුර්හි දී සාර්ථකත්වය ලැබීම උදෙසා අවශ්‍ය කරන ජාතික සහායට යටින් වල කැපෙනු ඇති බවට ද උත්සුකතා ඇති වී තිබේ.... දැනට ආන්ඩු හා ආරක්ෂක නිලධරයෝ, තමන් දැනට සිටින මට්ටමේ දෘඩතරව ඉඳිමින් "එහි තර්කානුකූල අවසානය" යැයි ඔවුන් හඳුන්වන තත්වයට සටන ගෙනයාමට අධිෂ්ඨාන සහගතව සිටිති."

රටේ ඇෆ්සනිස්ථාන දේශ සීමාවට ඔබ්බේ සිටින එක්සත් ජනපද හා නැටෝ හමුදා සමග සහයෝගීව කර ගෙන යන මෙම කැරලි විරෝධී කුරිරු මෙහෙයුම් ෆාටා ප්‍රදේශය තුල දිගින් දිගට පවතින ප්‍රතිරෝධයක් ද සමස්තයක් ලෙස පකිස්ථානුවන් අතර ම විරුද්ධත්වයක් ද අවුලුවනු නිසැක ය. ඇෆ්සනිස්ථානයෙහි එක්සත් ජනපද නායකත්වයෙන් යුත් මිලිටරි වාඩි ලා ගැනීමටත් දේශ සීමා ප්‍රදේශවල සිදු වන යුද්ධයටත් ජනගහනයේ අතිමහත් බහුතරය විරුද්ධ බව මත විමසුම්වලින් යලි යලිත් පෙන්නුම් කොට තිබේ. ෆාටා ප්‍රදේශයේ වැඩි හරිය දැන් පාලනය කෙරෙන්නේ නොයෙක් ඉස්ලාමීය සහ ගෝත්‍රික සන්නද්ධ කන්ඩායම් විසිනි. ඇෆ්සනිස්ථානයෙහි සිදු වන වාඩි ලා ගැනීමට එරෙහි කැරැල්ලට නව සටන්කරුවන් බඳවා ගැනීමේ දී මේ සන්නද්ධ කන්ඩායම් කිසිදු අපහසුවකට මුහුන දී නැත.

යුද්ධයෙන් පකිස්ථාන මිලිටරිය තුල බෙදීම් ඇති වීමේ අනතුර ද මතු වෙමින් පවතියි. සැප්තැම්බර් 11 දා ත්‍රස්තවාදී ප්‍රහාරවලින් අනතුරුව සබඳතා කපා හරින ලෙස බුෂ් පාලනාධිකාරය විසින් ඉස්ලාමාබාදයට බල කෙරෙන්නට පෙර 1990 ගනන්වල දී ඇෆ්සනිස්ථාන තලේබාන් තන්ත්‍රයට සහාය දීමේ දී මේ මිලිටරිය ප්‍රධාන කාර්ය භාරයක් ඉටු කලේ ය. නිලධර කන්ඩායම් ද ඇතුලුව පකිස්ථාන යුද හමුදාවේ සැලකිය යුතු සංඛ්‍යාවක් ජනවාර්ගික වශයෙන් ගත් කල පෂ්තූන්වරුන් වන අතර, ගෝත්‍රික ප්‍රදේශවල විශාල වසයෙන් සිටින පෂ්තූන් ජනයාට විරුද්ධව යුද්ධයක් කර ගෙන යාමට ඔවුන් සතුරු ය.

ජනාධිපති සර්දාරිගේ බිඳෙනසුලු බල ස්ථාවරයට රටේ ආර්ථික ගැටලුවලින් තව දුරටත් වල කැපේ. තෙල් සහ අනෙකුත් ආනයන සඳහා දරන්නට සිදු වූ ඉහල වියදම නිසා පසු ගිය මාස තුනේ දී විදේශ විනිමය සංචිත වේගයෙන් පහත වැටී ඇත. වර්ධන අනුපාතිකය පහල අගයක් දක්වා සංශෝධනය කොට තිබේ. උද්ධමන අනුපාතිකය දැන් සියයට 25ට ලඟා වී ඇති අතර විරැකියාව ඉහල යමින් පවතියි. නිරන්තරව පවතින බලශක්ති හිඟය කාර්මික හා කෘෂිකාර්මික නිෂ්පාදනයට නොකඩවා පහර දෙයි. මේ වන විට පකිස්ථානයෙහි ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ දූත කන්ඩායමක් සිටින අතර, මේ සතියේ නිකුත් වීමට නියමිත එහි වාර්තාවෙන්, මොන යම් හෝ තව දුර ආධාරයක් ලබා දීමට නම් තව තවත් පටි තද කර ගැනීමේ පිලිවෙත් ක්‍රියාවට නැංවිය යුතු යැයි නිසැකව ම බල කෙරෙනු ඇත.

මැරියට් හෝටලයේ බෝම්බ ප්‍රහාරය වනාහි පකිස්ථාන ආන්ඩුව මුහුන දෙමින් සිටින වඩාත් නරක අතට හැරෙන දේශපාලන හා සමාජ අර්බුදයේ එක් ලක්ෂනයක් පමනි. ජනාධිපති සර්දාරි, පකිස්ථානයෙහි ප්‍රජාතන්ත්‍රවාදය පුනස්ථාපනය කරන බවට ඔහු කරන පුච්චානම් කතා තිබිය දී ම, මිලිටරි බලවන්තයෙකු වූ ජනරාල් මුෂාරෆ් ව්‍යවස්ථාවට ඇතුලත් කල සියලු පුලුල් බලතල එලෙස ම පවත්වා ගෙන තිබේ. සෙනසුරාදා පාර්ලිමේන්තුව හමුවේ කල කතාවේ දී මේ කාරනය පිලිබඳව නිශ්චිත අදහසක් පල කිරීමෙන් සර්දාරි හිතාමතා ම වැලකුනේ ය. ඔහු කීවේ පාර්ලිමේන්තු කමිටුවක් මගින් ජනාධිපතිවරයාගේ බලතල "යලි සලකා බැලෙනු" ඇති බව පමනි. පැහැදිලි නිගමනය නම්, තමාගේ පාලනයට විරුද්ධව වේගයෙන් පැන නැගෙමින් පවතින විරුද්ධත්වය සමග පොර බඳනු වස් මුෂාරෆ්ට මෙන් ම සර්දාරිට ද ව්‍යවස්ථාවෙහි මේ ඒකාධිපති බලතල පැවතීම අවශ්‍ය ය යන්න යි.